Department of Education,Sabaragamuwa Province/ Weekly School

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -

ශ්‍රේණිය - 10 (2 වාරය)

විෂය - නර්තනය

සතිය - ජුනි 01

1) නිපුණතාවය - 5. ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුමය රැක ගනියි.

2) නිපුණතා මට්ටම - 5.3 ශ්‍රී ලාංකේය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.

3) පාඩම හෝ ඒකකය- 5 : 3 : 1 සොකරි ගැමි නාටකය පිළිබඳව තතු විමසා බලමු.

4) ඉගෙනුම් ඵල -

- ❖ සොකරි ජන නාටකය පවත්වන ප්‍රදේශ නම් කරයි.
- ❖ සොකරි නාටකය පවත්වන කාල සීමාව නම් කරයි.
- ❖ මෙම ගැමි නාටකයේදී යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ හදුන්වයි.
- ❖ සොකරි කවි ගායනා නියමිත නාදමාලාවට අනුව ගායනා කරයි.
- ❖ සොකරි කතා පුවත අවබෝධයෙන් ඉදිරි දිනකදී පංති කාමරය තුළ ඉදිරිපත් කරයි.
- ❖ සොකරි කවි එකතුවක් නිර්මාණය කරයි.

5) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- ❖ සොකරි ජන නාටකයට අදාල සී.ඩී තැටි, වීඩියෝ, පින්තූර නරඹයි.
- ❖ පොත් පත්, පුවත්පත් ලිපි, සඟරා ආදිය පරිශීලනය කරයි.
- ❖ සොකරි ජන නාටකය පිළිබඳව තොරතුරු රැස් කරයි.

පහත දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යනය කර ඒ ඇසුරින් කාර්ය පත්‍රිකාවේ දී ඇති ක්‍රියාකාරකම් වල නිරත වන්න.

**කාර්ය පත්‍රිකාව**

1. සොකරි ජන නාටකය පවතින ප්‍රදේශ මොනවාද?
2. සොකරි නාටකයට අදාළ කතා පුවත ලියා දක්වන්න.
3. සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු හා පවත්වන කාල සීමාව නම් කරන්න.
4. මෙහිදී භාවිතයට ගන්නා වාද්‍ය භාණ්ඩ මොනවාද?
5. සොකරි නාටකයට අදාළ කවි 02 ක් නියමිත තාල රූප වලට අනුව ගායනා කරන්න.
6. ගුරු හාමි හා සොකරි යන චරිත 02 ට අදාළ කවි 02 ක් ලියන්න.

6) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, Website , LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක.

- ❖ e- තක්සලාව - https://www.e-thaksalawe.mo.go.lk
- ❖ e- නැණ පියස - Course : 10 වසර නර්තන කලාව
- ❖ වෙනත් - Youtube - https://youtube.com/watch?v=Y9j7BIWDBW8
  https://youtube.com/watch?v=RsKAneIhRJo
  https://youtube.com/watch?v=Au69UmKHqzo

**කියවීම් පත්‍රිකාව**

- ➢ උඩරට සම්ප්‍රදායට අයත් සොකරි ජන නාටකය අප්‍රේල්, මැයි, ජුනි මාස වලදී පවත්වනු ලැබේ.
- ➢ මෙම ජන නාටකය ප්‍රචලිත ප්‍රදේශ ලෙස උඩරට වන්නි සහ බදුල්ල ප්‍රදේශ නම් කළ හැක. තවද හඟුරන්කෙත, මාතලේ, ලග්ගල, බටුවත්ත, කොනකගල ප්‍රදේශ වල ප්‍රචලිතය.
- ➢ සොකරි ජන නාටකය පැවැත්වීමේ අරමුණු වන්නේ පූජාර්ථය, සස්ශ්‍රිකත්වය, විනෝදාස්වාදයයි.
- ➢ බොහෝ පළාත්වල වාදනය සඳහා ගැට බෙරය භාවිතා කරන අතර ඌව ප්‍රදේශයේ දවුල ද වන්නි ප්‍රදේශ වල උඩැක්කියද ප්‍රධාන වාද්‍ය භාණ්ඩ ලෙස භාවිතා කරයි.
- ➢ සොකරි නාටකයේ ගායනයට විශේෂ තැනක් හිමිවේ.
- ➢ සොකරි ජන නාටකයට අදාළ කතා පුවත සොකරිය නම් ප්‍රධාන චරිතය වටා ගෙතී පවතී. වෙදරාල, ආඬිගුරු (ගුරුහාමි), පරයා මෙහි සෙසු චරිත වේ.
- ➢ ගුරුහාමි හා සොකරිය විවාහ වූ නමුත් දරුවන් නොමැති නිසා ලක්දිවට පැමිණෙන අතර එහිදී වෙද රාළගේ බල්ලා ගුරුහාමිගේ කකුල සපා කයි. වෙදරාල සමග සම්බන්ධයක් පවත්වන සොකරි ඔහු හා පලා යයි. පසුව ගුරුහාමි ඇය කැඳවාගෙන එන අතර ඇයට දරුවකු ලැබේ.

7) අතිරේක පොත් පත් / සඟරා

- ❖ සිංහල නර්තන කලාව - මහාචාර්ය මු. දිසානායක මහතා.
- ❖ 10 ශ්‍රේණිය නර්තනය - ඥානසිරි පීරිස් මහතා.
- ❖ 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන ආයතනය

**සැකසුම -** **නම** - **එස්. එම්. ඩි. බී. එස්. කෞශල්‍යා සේනාරත්න**

**අධ්‍යාපන ආයතනය** - **කෑ/දෙහි/ හුඹස්වලාන ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**